රජයේ දැනුම්දීමයි

# මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## ජාතික මීලාදුන් නබි උත්සවය -2018

2018 වසරේ පැවැත්වීමට නියමිත ජාතික මීලාදුන් නබි උත්සවයට සමගාමීව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ඒකකය පාසල් සිසුන් අතර පහත සඳහන් අංශ යටතේ තරඟ පැවැත්වීමට තීරණය කර ඇත.

1. ප්‍රාථමික අංශයඃ- 4, 5 ශ්‍රේණි
2. කනිෂ්ඨ අංශයඃ- 6 7,8 ශ්‍රේණි
3. ද්විතීය අංශය ඃ- 9,10,11 ශ්‍රේණි
4. ජ්‍යෙෂ්ඨ අංශය 12, 13 ශ්‍රේණි

- ශිෂ්‍යයන් සහ ශිෂ්‍යයාවන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් පැවැත්වෙන තරඟ - කිරාඅත්, හිෆ්ල් , කථික තරඟ , ඉස්ලාමීය සංස්කෘතිකාංග
  ශිෂ්‍යයන් සහ ශිෂ්‍යයාවන් වෙනුවෙන් පොදුවේ පැවැත්වෙන තරඟ - රචනා , කෙටිකතා , කාව්‍ය , අරාබි අක්ෂර කලාව
  එක් තරඟකරුවකුට පහත සඳහන් තරඟ අතරෙන් එක් තරඟයට පමණක් සහභාගි විය හැකි අතර සංස්කෘතික තරඟ සඳහා මෙම සීමාව අදාල නොවේ
- නෙහැර එක් තරඟයකට පමණක් සහභාගි විය හැකි අතර පසුගිය වසරේ ජ්‍යෙෂ්ඨ අංශයෙන් ජාතික මට්ටමින් පළමු ස්ථානය ගත් අය හැර ගිය අවුරුදේ පළමු ස්ථානය ගත් සෙසු අංශවල තරඟකරුවන්ට එම අංශයේම තරඟවලට මෙවර තරඟවලට සහභාගි විය නොහැකි ය.

| | ශිෂ්‍යයන් සහ ශිෂ්‍යයාවන් වෙන් වෙන් වශයෙන් පැවැත්වෙන තරඟ | | | |
|---|---|---|---|---|
| | තරඟය | | අංශය | මාතෘකාව |
| 1 | කිරාඅත් (තජ්වීද් ක්‍රමයට මිහිරිව පාරායනය කළ යුතු ය.) | 4, 5 ශ්‍රේණි | ප්‍රාථමික | ජුසු අම්ම 30 වන ජුසුව<br>جزء عم ( جزء ثلاثين)<br>(වාක්‍යයන් 10කට නොඅඩු විය යුතුයි) |
| | | 6 , 7 ,8 ශ්‍රේණි | කනිෂ්ඨ | තබාරකල්ලති 29වන ජුසුව<br>جزء التاسع وعشرين<br>(වාක්‍යයන් 12කට නොඅඩු විය යුතුයි) |
| | | 9,10,11 ශ්‍රේණි | ද්විතීය | සූරතුල් වාකියා , සූරතුල් යාසීන් , සූරතුල් සජදා , සූරතුල් හුජ්රාත්, සූරතුල් රහුමාන්,<br>سورة الواقعة، سورة يس، سورة السجدة، سورة الحجرات، سورة الرحمن<br>(වාක්‍යයන් 15කට නොඅඩු විය යුතුයි) |
| | | 12, 13 ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ | සූරතුල් බකරා, සූරතුල් ආල ඉම්රාන් , සූරතුල් නිසා<br>سورة البقرة ، سورة آل عمران، سورة النساء<br>(වාක්‍යයන් 15කට නොඅඩු විය යුතුයි) |
| 2 | හිෆ්ල් කුර්ආන් (වනපොත් කිරීම) | 4, 5 ශ්‍රේණි | ප්‍රාථමික | සූරා නාස් පටන් සූරා සම්ස් දක්වා<br>سورة الناس සිට سورة الشمس දක්වා |
| | | 6 7,8 ශ්‍රේණි | කනිෂ්ඨ | සූරා නාස් පටන් සූරා හාසියා දක්වා<br>سورة الناس - سورة الغاشية |
| | | 9,10,11 ශ්‍රේණි | ද්විතීය | සූරා නාස් පටන් සූරා නබඃ දක්වා<br>سورة الناس - سورة النبأ - |
| | | 12, 13 ශ්‍රේණි | ජුසු 29 ජුසු30 تبارك الذي , جزء عم | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 3 කථික තරග<br><br>දෙමළ, සිංහල, ඉංග්‍රීසි හා අරාබි භාෂාවලින් පැවැත් වේ | | අංශය | මාතෘකා | කාලය |
| | 4, 5 ශ්‍රේණි | ප්‍රාථමික | මහලු අයට ගරුකරමු | මිනිත්තු 4 |
| | 6 , 7,8 ශ්‍රේණි | කනිෂ්ඨ | කුඩා ළමුන්ට කරුණාව දක්වමු | මිනිත්තු 5 |
| | 9,10,11 ශ්‍රේණි | ද්විතීය | 1 සලාත් අශිලාචාරකමින් හා පිළිකුල් ක්‍රියාවලින් රැක ගනියි<br>2. නබි (සල්) මෙලොවට උතුම් දායාදයකි.<br>(එක් මාතෘකාවකට පමණක් සූදානම් විය යුතු ය) | මිනිත්තු 7 |
| | 12, 13 ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ | 1.දිළිඳුකම තුරන් කිරීමට ඉස්ලාම් ආගමේ දායකත්වය<br>2.මව් බිම ගොඩ නැංවීමේ දී මුස්ලිම් පුරවැසියාගේ යුතුකම<br>(මාතෘකා දෙකටම සූදානම් විය යුතු ය) | මිනිත්තු 10 |
| | | | ශිෂ්‍යයන් සහ ශිෂ්‍යයාවන් සඳහා පොදුවේ පැවැත්වෙන තරග | |
| තරගය | | අංශය | මතෘකාව | වචනය හා වෙලාව |
| 4 රචනා තරග<br><br>දෙමළ, සිංහල, හා ඉංග්‍රීසි භාෂාවලින් පැවැත් වේ | 4, 5 ශ්‍රේණි | ප්‍රාථමික | උපවාසයේ උතුම් බව | වාක්‍ය 20 පැය 01ක් |
| | 6 , 7,8 ශ්‍රේණි | කනිෂ්ඨ | ඉස්ලාමය පවසන සංහිඳියාව | වචන 200 පැය 1 වි.30 |
| | 9,10,11 ශ්‍රේණි | ද්විතීය | 1 ඉස්ලාමිය දෘෂ්ඩි කෝණයෙන් පවුල් ජීවිතය<br>2. සමාජ උන්නතියට මස්ජිද්වල දායකත්වය<br>(මාතෘකා දෙකටම සූදානම් විය යුතු ය) | වචන 300පැය 2ක් |
| | 12, 13 ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ | 1 ඉස්ලාම් පවසන ආදර්ශමත් නායකත්වය<br>2 කාලීන ආර්ථික ප්‍රශ්ණවලට ඉස්ලාම් ඉදිරිපත් කරන විසඳුම් (මාතෘකා දෙකටම සූදානම් විය යුතු ය) | වචන 400<br>පැය 2. වි. 15ක් |
| තරගය | | අංශය | මාතෘකාව | |
| 5 කෙටිකතා<br><br>(සිංහල සහ දෙමළ භාෂාවලින් පැවැත් වේ)<br>(ඉස්ලාමීය සීමාවන් තුළ පිහිටිය යුතුය) | 9,10,11 ශ්‍රේණි | ද්විතීය | දෙමව්පියන්ට ආදරය කරමු<br>(ඉස්ලාමීය ආදර්ශයන්ට අනුකූල විය යුතුය) | වචන 350කට නො අඩුව<br>පැය 3ක් |
| | 12, 13 ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ | රාජකාරියට කැපවෙමු<br>((ඉස්ලාමීය ආදර්ශයන්ට අනුකූල විය යුතුය) | වචන 500 කට නො අඩුව<br>පැය 3ක් |
| | | | | පේළි 30කට නොඅඩුව<br>පැය 1.වි.30ක් |
| | | | | පේළි 60කට නොඅඩුව |

| | | | | |
|---|---|---|---|---|
| 06 කාව්‍ය<br>දෙමළ බසින් පමණි<br>(ශිෂ්‍යයශිෂ්‍යයාවන්<br>සඳහා පොදුවේ<br>පවත්වනු ලැබේ) | 9,10,11<br>ශ්‍රේණි | ද්විතීය | අධ්‍යාපනයට දිරිගන්වන ඉස්ලාම්<br>(ඉස්ලාමීය ආදර්ශයන්ට අනුකූල විය යුතුය) | පැය 2ක් |
| | ද්විතීය<br>12, 13 ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ | ආදර්ශමත්ව ජීවත්වූ නබිනායකතුමන්<br>( ඉස්ලාමීය ආදර්ශයන්ට අනුකූල විය යුතුය ) | පේළි 30කට නොඅඩුව<br>පැය 1.වි.30 |
| අරාබි අක්ෂර කලාව | | ද්විතීය | واتقوا الله ويعلمكم الله | සුදු පැහැති බ්‍රිස්ටල් බෝඩ් මත කලු පැහැති තීන්තයෙන් ඇඳිය යුතුය. සත්ව රූප ඇඳීමෙන් වැළකිය යුතුය.<br>අරාබි අක්ෂරවලින් පමණක් සියලු අලංකරණයන් කළ යුතුය.<br>පැය 3ක් |
| | | ජ්‍යෙෂ්ඨ | ان أكرمكم عند الله أتقاكم | |

## ඉස්ලාමීය සංස්කෘතික වැඩසටහන් (විවෘත තරඟ)

ඉස්ලාමිය පාරම්පරික සංස්කෘතිය ඔපනැංවෙන ආකාරයට තිබිය යුතුය

ශිෂ්‍යයන් සහ ශිෂ්‍යයාවන් සඳහා වෙන වෙනම තරඟ පැවැත්වේ

| ඉසව් අංකය | තරඟය | අංශය | මාතෘකාව | නීති රීති |
|---|---|---|---|---|
| 08 | ඉස්ලාමීය සංස්කෘතික අංගය | ප්‍රාථමික කාන්තා | අරාබි කසීදා (නබිතුමා වර්ණනා කරන කසීදා ) - මිනිත්තු 07 ක් | සිසුවියන් 6 දෙනකු පසුබිම් ආලෝකය හෝ සංගීතය නොමැතිව අරාබි බසින් කසීදා (රබාන පමණක් භාවිත කළහැකිය) |
| | | ප්‍රාථමික පිරිමි | අරාබි කසීදා (නබිතුමා වර්ණනා කරන කසීදා) - මිනිත්ත 07 ක් | සිසුන් 6 දෙනකු පසුබිම් ආලෝකය හෝ සංගීතය නොමැතිව අරාබි බසින් කසීදා (රබාන පමණක් භාවිත කළහැකිය) |
| | | කනිෂ්ඨ අංශය පිරිමි | ඉස්ලාමිය පූර්වාදර්ශවලට අනුකූලව ගායනා කිරීම<br>ගැමි ගීත සමග ලී කෙළි නැටුම<br>- මිනිත්තු 10 ක් | සිසුන් 08 දෙනකු (ලී හා තාලම්පොට පමණක් භාවිත කළහැකිය) |
| | | කනිෂ්ඨ අංශය කාන්තා | අරාබි කසීදා (නබිතුමා වර්ණනා කරන කසීදා) - මිනිත්තු 07 ක් | සිසුවියන් 6 දෙනකු පසුබිම් පසුබිම් ආලෝකය හෝ සංගීතය නොමැතිව (රබාන පමණක් භාවිත කළ හැකිය) මිනිත්තු 07 ක් |
| | | ද්විතීය පිරිමි | ගැමි ගීත සමග ලී කෙළි නැටුම<br>- මිනිත්තු 10 ක් | සිසුන් 08, (ලී හා තාලම්පොට පමණක් භාවිත කළහැකිය) |
| | | ද්විතීය කාන්තා | ඉස්ලාමීය මාතෘකාවක් පැහැදිලි කිරීමේ දෙබසක් මිනිත්තු 10ක් | සිසුවියන් 07 දෙනකු සහභාගිවන සිසුවියන් සියලු දෙනාම දෙබසට සම්බන්ධවි යුතු අතර නාට්‍ය ශෛලියෙන් නොමැතිව අංග ශෛලියෙන් (Body Language) ඉදිරිපත් කළ හැක . ඉස්ලිමිය සංස්කෘතියට ගැලපෙන ලෙෂ ඇඳුම් ඇඳිය යුතුය. |
| | | ජ්‍යෙෂ්ඨ පිරිමි පමණි | ඉස්ලාමීය නාට්‍යයක් මිනිත්තු 15ක් | සිසුන් 11 දෙනකු සිටිය යුතුය. තරඟ අවස්ථාවේදි නාට්‍ය පිටපත විනිශ්චය කරුවන්ට ලබා දිය යුතු ය. |

| |
|---|
| ඉහත සඳහන් ඉස්ලාමීය සංස්කෘතික තරගවල දී එක් පාසලකට තරග ඉසව් දෙකකට පමණක් සහභාගි විය හැකි ය. |

පොදු නීති රීති

- සියලුම නිර්මාණ ඉස්ලාමිය ආදර්ශයන්ට අනුකූල විය යුතුය. තුල
- මූලික තරග පිළිවෙළින් පාසල් මට්ටම්, කළාප මට්ටම්, පළාත් මට්ටම් වශයෙන් ද අවසාන තරඟය ජාතික මට්ටමින් ද පවත්වනු ලබන්නේ ය.
- පළාත් මට්ටමින් ලිඛිත තරඟවලින් (රචනා, කෙටිකතා , කාව්‍ය , අරාබි අක්ෂර කලාව) ප්‍රථම ස්ථානය ලබාගත් තරඟකරුවන් ජාතික මට්ටමින් පවත්වන තරඟයට පෙණී සිටි යුතුයි.
- ඉහත සඳහන් තොරතුරු ඇතුළත් පාසල් මට්ටමේ ඉල්ලුම්පත්‍ර අඟල් 12x 8 කඩදාසියක ලැයිස්තු ගත කර (නම ලිපිනය ආදිය ඉංග්‍රීසියෙන් ඇත්නම් වඩාත් සුදුසු ය) එය විදුහල්පති තුමා විසින් සහතික කරවා මධ්‍යම, නැගෙනහිර, බස්නාහිර, වයඹ යන පලාත් වල ඉල්ලුම්කරුවන් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුනට ද අනෙක් පළාත්වල ඉල්ලුම්කරුවන් අදාල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වරු වෙත ද 2018.05.08 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. (ලියුම් කවරයේ ඉහළ කෙළවරේ ජාතික මීලාද් තරඟ -2018 යැයි සඳහන් කළ යුතුය )
- පළාත් මට්ටමේ තරඟ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ අධීක්ෂණය යටතේ පැවැත් වේ. අවශ්‍ය වූ අවස්ථාවල දී මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන අමාත්‍යංශයේ මුස්ලිම් පාසල් ඒකකයේ අධ්‍යක්ෂකගේ යෝජනාද ලබාගැනේ.

  සියලුම පළාත්වල ප්‍රතිඵල 2018.07.23 දිනට ප්‍රථම මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට ලබා දිය යුතුය.

**අධ්‍යක්ෂ**

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව,
180, ටී.බී. ජායා මාවත
කොළඹ - 10
දුරකතන අංකය 011-2669997